සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

පැය එකයි
One hour

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ (X) ලකුණ යොදන්න.

01. මානවයා භාවිතා කරන ප්‍රාථමික සන්නිවේදන ක්‍රමයකි.
(1) පුවත්පත (2) දැන්වීම් පුවරුව
(3) සමාජ ජාල වෙබ් අඩවිය (4) තලා නාදය

02. ඔබගේ නිවසේ ආලේප කර ඇති තීන්තවල වර්ණය අවාචික සන්නිවේදනය අනුව,
(1) පාරභාෂා සාධකයකි. (2) සමාජීය සාධකයකි.
(3) පාරිසරික සාධකයකි. (4) ශාරීරික සාධකයකි.

03. බලධාරියෙකුගේ අත්සන යෙදීම උදෙසා නීත්‍යානුකූලභාවය ලබාදෙන මාධ්‍ය උපකරණය,
(1) ගණක යන්ත්‍රය නම් වේ. (2) නිල මුද්‍රාව නම් වේ.
(3) දින මුද්‍රාව නම් වේ. (4) තැපැල් මුද්‍රා යන්ත්‍රය නම් වේ.

04. ජනමාධ්‍ය ආයතන අධ්‍යයනය පිළිබඳ පහත ප්‍රකාශ නිරීක්ෂණය කරන්න.
A "සත්‍ය මාර්ගය" නමැති පුවත්පත ආගමික සංවිධානයකට අයත් වූවකි.
B නිදහස් මාධ්‍යවේදීන් ද ජනමාධ්‍ය ආයතනයේ කොටස්කරුවන්ය.
C ගුවන් විදුලි කාර්ය මණ්ඩලයට ගුවන්විදුලි මාධ්‍ය උපදේශක තනතුර ඉතා වැදගත්වන්නකි.
D පෞද්ගලික ජනමාධ්‍ය ආයතනයක සභාපති ප්‍රධාන විධායකයා වූ විට, එහි ප්‍රතිපත්ති සම්පාදනය හා කළමනාකරණ කටයුතු සිදු කරන්නේ කොටස් හිමිකරුවන්ය.
ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,
(1) AB පමණි. (2) BC පමණි. (3) AC පමණි. (4) ABCD යන සියල්ල

05. මානව සමාජයක උන්නතිය හා පැවැත්ම සඳහා ඇති සංස්කෘතිකාංගය වන්නේ,
(1) සමාජ ප්‍රතිරූපය යි. (2) මානව ධර්මතාව යි.
(3) පුරවැසිභාවය යි. (4) සංවර්ධනාත්මක චින්තනය යි.

06. නිශ්චල කැමරාව බිහිවීමට පදනම්වන මාධ්‍ය උපකරණය හැඳින්වෙන්නේ,
(1) කැමරා ඔබ්සිකියුරාව නමිනි. (2) මැජික් ලැන්තෑරුම නමිනි.
(3) සේයාපටලය නමිනි. (4) විනිවිදකය නමිනි.

07. තොරතුරුවල ගුණාත්මකබව සුරැකීමට අදාළ සාධක දක්වා ඇති කාණ්ඩය තෝරන්න.
(1) නිවැරදිබව - නිශ්චිතබව - කාලෝචිතබව - ගැටුම.
(2) අසාමාන්‍යබව - බලපෑම - වැදගත්කම - නිශ්චිතබව.
(3) සහේතුකබව - අර්ථාන්විතබව - කැපී පෙනීම - බලපෑම.
(4) නිවැරදිබව - අර්ථාන්විතබව - නිශ්චිතබව - සහේතුකබව.

08. තොරතුරු රැස්කිරීමේ ශිල්පීය ක්‍රමවලට අදාළ නිරවද්‍ය වගන්තිය තෝරන්න.
(1) විවිධ ලේඛන ඇසුරින් තොරතුරු ලබාගැනීම එතරම් විශ්වාසදායක නොවනු ඇත.
(2) සෑම විටම මතය සනාථ වන තොරතුරු එක්රැස් කිරීමට මාධ්‍යවේදියා වගබලාගත යුතුය.
(3) කිසියම් තේමාවක්, අරමුණක් පිළිබඳව පුද්ගල සමූහයකගේ අදහස් ඒකරාශි වීමක් බුද්ධි කලම්බනය තුළ තිබිය යුතුය.
(4) යටිකුරු පිරමිඩ ආකෘතිය නිර්මාණාත්මක වාර්තාකරණයට යොදන ප්‍රධානම න්‍යාය වනු ඇත.

09. DTP ක්‍රියාවලියට අදාළ සවිස්තරයක් පහත දැක්වේ.

A අත්පිටපත සැකසීම යතුරු ලියනය මගින්ද සිදු කළ හැක.

B බබල්ජෙට් මුද්‍රණයන්ත්‍රයෙන් ලබාගත් මුද්‍රිත පිටපත අක්ෂර තිත් වලින් දර්ශනය වේ.

C රූ රටා සංස්කරණයට කොරල්ඩ්‍රෝ මෘදුකාංගය භාවිත කළ හැක.

D පිටු බැඳීම හා කවර යෙදීම DTP ක්‍රියාවලියට බැහැරින් යෙදෙන්නකි.

මේ අතුරින් නිවැරදි ප්‍රකාශ විය හැක්කේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) B හා D පමණි.

10. කෙනෙකුගේ පංචේන්ද්‍රිය මගින් ලැබෙන සන්දේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම,

(1) සහවේදනයයි. (2) සහජ හැකියාවයි. (3) විසම්මුතියයි. (4) සංජානනයයි.

11. රූපවාහිනී සන්නිවේදකයකු තම සන්නිවේදන කාර්යය කිරීමේදී ඔහු වෙත පැවරෙන වගකීම වඩාත් තීව්‍ර වන්නේ ලැබුණු තොරතුරු,

(1) විධිමත් සන්නිවේදන ආකෘතියක් ලෙස පවතින විට දී ය.

(2) විධිමත් සන්නිවේදන ස්වරූපයක් ලෙස පවතින විට දී ය.

(3) අවිධිමත් සන්නිවේදන දාමයක් ලෙස පවතින විට දී ය.

(4) සන්නිවේදන බාධකවලින් යුක්තවන විට දී ය.

12. G.D. පැලිස් අප්පුහාමි මහතා සංස්කරණ කළ පුවත්පත,

(1) 'දිනමිණ' නමින් හැඳින්වේ. (2) 'ලංකා ලෝකය' නමින් හැඳින්වේ.

(3) 'කවට කතිකයා' නමින් හැඳින්වේ. (4) 'සිංහල බලය' නමින් හැඳින්වේ.

13. නිශ්චල ඡායාරූප ශිල්පයේදී දෘෂ්ටිකෝණය හඳුනාගැනීම යන්න හඳුන්වන විශේෂ නාමය,

(1) අනාවරණය නම් වේ. (2) මානනය නම් වේ.

(3) නාභිගත කිරීම නම් වේ. (4) ස්වර්ණමය රීතිය නම් වේ.

14. පහත ප්‍රකාශ අතුරින් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) පවුලේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කිරීම ආර්ථික නියෝජන අධ්‍යයනයට අයත් කාර්යයකි.

(2) සමාජ ශුභ සාධන කාර්යට උරදීම රජය සතු කාර්යයක් මිස පුරවැසියාගේ කාර්යයක් නොවීම.

(3) ලිබරල්වාදී මතයකට ශ්‍රී ලාංකීක වෙළඳපල මෙහෙය වීම ජනමාධ්‍ය සතු ජාතික වගකීමකි.

(4) ස්ත්‍රී පුරුෂයාට පවරා ඇති වගකීම් විවරණය කිරීම ස්ත්‍රී - පුරුෂ සමාජභාවයට අයත් වීම.

15. 'ප්‍රවෘත්තියක් යනු ජනතාවට බලපාන්නාවූත්, ඔවුන් තුළ උනන්දුවක් ඇති කරන්නාවූත්, මෑත කාලීන වැදගත් සිදුවීමකට අදාළ අලුත් තොරතුරකි.' ..... මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

(1) මිල්ටනි බ්‍රෂ් ය. (2) චාර්ල්ස් ඇන්ඩර්සන් ඩානා ය.

(3) පෝල්ඩී මැසෙනියර් ය. (4) වෝල්ටර් ලිප්මාන් ය.

16. උත්තල මුද්‍රණ ශිල්පය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A උත්තල මුද්‍රණ ක්‍රමයේදී අකුරු තෙරපී කඩදාසියට තීන්ත උරාගනු ඇත.

B උත්තල මුද්‍රණ ක්‍රමයෙන් ලබාගත් පිටපත අක්ෂර නොමැකී දිගු කාලයක් පවත්වාගත හැක.

C උත්තල මුද්‍රණ ක්‍රමයේදී මැටරය නැවතක සෑදීම අනිවාර්යය කොන්දේසියකි.

D උත්තල මුද්‍රණ ක්‍රමයේදී භාවිත කඩදාසි වර්ගය සමතල මුද්‍රණ ක්‍රමයට සුදුසු නැත.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) A, B හා C පමණක් සත්‍ය වේ. (2) A, B හා D පමණක් සත්‍ය වේ.

(3) A, C හා D පමණක් සත්‍ය වේ. (4) B, C හා D පමණක් සත්‍ය වේ.

17. පන්ති කාමරයේ ගණිත පාඩමක් ඉගැන්වීමක නිරත වූ ගුරුතුමෙකු රූපසටහන් අඳිමින්, ඒවා විස්තර කරමින් සිය පාඩම කළේ ය. එහිදී බොහෝ සිසුන් ගුරුතුමාගේ විස්තරයට ඇහුම්කන් දී තමාට මතක කොටස් පමණක් සටහන් කරගත්තේ ය. මෙහිදී ක්‍රියාත්මක සන්නිවේදන ස්වරූප / විධි වල අනුපිළිවෙල වන්නේ,

(1) දෘශ්‍ය - ශ්‍රව්‍ය - වාචික - ලිඛිත සන්නිවේදනයයි. (2) ලිඛිත - වාචික - ශ්‍රව්‍ය - දෘශ්‍ය සන්නිවේදනයයි.

(3) ලිඛිත - දෘශ්‍ය - වාචික - ශ්‍රව්‍ය සන්නිවේදනයයි. (4) දෘශ්‍ය - වාචික - ශ්‍රව්‍ය - ලිඛිත සන්නිවේදනයයි.

18. පොදු වැස්සක් මධ්‍යයේ ක්‍රිකට් තරඟයක් වීඩියෝගත කරමින් සිටි සුවිනීතාට දිස්වූයේ වීඩියෝ කරන ලද රූපාවලිය බොඳ වූ ස්වභාවයක් ගෙන ඇති බවයි. මෙම තත්ත්වය,

(1) මාධ්‍ය බාධකයකි. (2) අර්ථ බාධකයකි.

(3) ශ්‍රව්‍ය බාධකයකි. (4) දෘශ්‍ය බාධකයකි.

19. මානවයා හැඟීම් - අදහස් - අත්දැකීම් එකිනෙකා සමඟ හුවමාරු කරගැනීම ආරම්භ කරන්නේ,

(1) නූතන මානව අවධියේ දී ය. (2) ප්‍රාග් ඓතිහාසික හෙවත් පැලියොලිතික් අවධියේ දී ය.

(3) නියන්ඩතාල් මානව යුගයේ දී ය. (4) මිසොසොයික ජීවී යුගයේ දී ය.

20. ප්‍රදීපාගාර උපක්‍රමය භාවිතයට ගැනෙනුයේ,
(1) අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ය. (2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ දී ය.
(3) කථිකයා හා සමූහය අතර සන්නිවේදනයේ දී ය. (4) රූපවාහිනී සන්නිවේදනයේ දී ය.

21. අන්තර්ජාල විද්‍යුත් තැපැල් ලිපිනයක් සකස් කරගැනීමට ඔබගේ මිත්‍රයකුට අවශ්‍ය වී තිබේ. ඒ සඳහා කොපමණ මුදලක් වැයවන්නේ දැයි ඔහු ඔබගෙන් විමසයි. ඔබ ලබාදිය යුතු වඩාත් නිවැරදි පිළිතුර කුමක්ද?
(1) විද්‍යුත් තැපැල් ලිපිනයක් සකසා ගැනීමට මුදල් ගෙවීම අනවශ්‍යය.
(2) සුළු මුදලක් වැය කිරීමෙන් විද්‍යුත් තැපැල් ලිපිනයක් සකස් කරවා ගත හැකිය.
(3) විද්‍යුත් තැපැල් ලිපිනයක් සකසා ගැනීමට අන්තර්ජාල හලකට (Internet cafe) විශාල මුදලක් ගෙවිය යුතුය.
(4) අන්තර්ජාලයට පිවිසීමෙන් නොමිලේ විද්‍යුත් තැපැල් ලිපිනයක් සකසා ගත හැකිය.

22. ප්‍රධාන ධාරාවේ මුද්‍රිත මාධ්‍ය වාර්තාකරුවකු නොවීමට ඉඩ ඇත්තේ,
(1) නිදහස් මාධ්‍ය වාර්තාකරු ය. (2) විකල්ප මාධ්‍ය වාර්තාකරු ය.
(3) මාණ්ඩලික මාධ්‍ය වාර්තාකරු ය. (4) අධිකරණ වාර්තාකරු ය.

23. පෞද්ගලික ව්‍යාපාරික ආයතන ප්‍රචාරණ කටයුතු වලදී සමාජ ප්‍රතිරූප ප්‍රභලව යොදා ගනී. එසේ වන්නේ,
(1) සමාජ ප්‍රතිරූප හා ජනමත සැකසීම අතර සෘජු සම්බන්ධයක් පවතින නිසා ය.
(2) සමාජ ප්‍රතිරූප ගොඩනැගෙන්නේ ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය නිසා ය.
(3) සමාජ ප්‍රතිරූපවල සමාජ පිළිගැනීම වෙළඳ ප්‍රතිපත්ති පිළිගැනීමට පොළඹවන නිසා ය.
(4) සමාජයේ සෑම අංශයකම සමාජ ප්‍රතිරූප ක්‍රියා කරන නිසා ය.

24. ප්‍රක්ෂේපණ මාධ්‍ය සම්බන්ධයෙන් පහත ප්‍රකාශ නිරීක්ෂණය කරන්න.
A ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍ර (OHP) ක්‍රියාත්මක කරවීමට කිසිදු පෙර උපකරණයක් පූර්ව සූදානම් කිරීම අවශ්‍ය නොවේ.
B අන්තර් ක්‍රියා පුවරුවට මෙන් ම ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයට පරිගණකය සම්බන්ධ වීම අනිවාර්ය වී ඇත.
C නිශ්චල ඡායාරූප පෙන්වීම පමණක් විනිවිදක ප්‍රක්ෂේපණ යන්ත්‍රය මගින් ඉටුකරගත හැක.
D පූර්ව සූදානමකින් තොරව තමා ලඟ ඇති සටහන් දර්ශනය කිරීමට යොදාගත හැකි හොඳම උපකරණය බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය වේ.
මේ ප්‍රකාශ අතුරින් පිළිගත හැකි ප්‍රකාශ වන්නේ,
(1) A හා B පමණි. (2) B හා D පමණි. (3) B හා C පමණි. (4) A හා D පමණි.

25. දිනපතා පුවත්පතක පළවූ ප්‍රවෘත්ති සිරස්තල කීපයක් පහත දැක්වේ.
I) දකුණේ ධීවර වරායක සිදුවූ වෙඩි තැබීමෙන් හතර දෙනෙක් මරුට.
II) හෘර්ද රෝගී දරුවා ඕස්ට්‍රේලියානු ක්‍රිකට් කණ්ඩායමේ සම නායකත්වටයට පත් කරයි.
III) හෝලි පූජාව යාපනය නගරයේ දී පැවැත්වේ.
IV) ධාරානිපාත වර්ෂාව නැගෙනහිර පළාතේ වන ජීවිතය අඩාල කරයි.
එම ප්‍රවෘත්ති අනුපිළිවෙලින් දෘඩ (Hard) හා මෘදු (Soft) පුවත් ලෙස නිවැරදිව වර්ගකර ඇති පිළිතුර තෝරන්න.
(1) දෘඩ - මෘදු - දෘඩ - මෘදු (2) දෘඩ - දෘඩ - මෘදු - මෘදු
(3) දෘඩ - මෘදු - මෘදු - දෘඩ (4) මෘදු - දෘඩ - මෘදු - දෘඩ

26. පුවත්පත් වාර්තාකරුවකු ග්‍රාම නිලධාරි තුමාගෙන් තොරතුරක් ලබාගෙන සති අන්ත පුවත්පතකට ප්‍රවෘත්තියක් රචනා කරයි. මෙහි සඳහන් ග්‍රාම නිලධාරිතුමා,
(1) ලිඛිත මූලාශ්‍රයකි. (2) මාධ්‍ය මූලාශ්‍රයකි. (3) ආයතනික මූලාශ්‍රයකි. (4) පුද්ගල මූලාශ්‍රයකි.

27. පහත ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) සඟරාව වූ කලි කිසියම් ක්ෂේත්‍රයක් අරමුණු කරගෙන නිශ්චිත කාල සීමාවකදී පළවන ලිපි හා රූප සහිත ප්‍රකාශනයක් ලෙස දැක්විය හැකිය.
(2) යම් තොරතුරක් සෘජුව මහජනතාව වෙත දැනුම් දීමට බෙදා හරින පත්‍රිකාව පෝස්ටරය නම් වේ.
(3) මහජනතාව උනන්දුවක් දක්වන ප්‍රවෘත්ති - සාහිත්‍ය - වෙළඳ දැන්වීම් පළ කරන මුද්‍රිත ස්වරූපය පුවත්පත නම් වේ.
(4) පිටු 49 කට නොඅඩු මුද්‍රිත කඩදාසි ගොනුව පොත ලෙස ප්‍රකාශ කළ හැකිය.

28. ඉරිදා ජාතික පුවත්පත් වල තම ජීවන වෘත්තියට අදාළ කිසිදු තොරතුරක් පළ නොවන බව ගොවීහු චෝදනා කළහ. මෙම තත්ත්වය,
(1) මාධ්‍ය නියෝජනය පිළිබඳ ගැටළුවකි. (2) සමාජීය නියෝජනය පිළිබඳ ගැටළුවකි.
(3) සදාචාරය පිළිබඳ නියෝජන ගැටළුවකි. (4) මානව හිමිකම් නියෝජනය පිළිබඳ ගැටළුවකි.

29. සාර්ථක ඡායාරූපයක ලක්ෂණයක් නොවන්නේ,

(1) නිසි මොහොත සටහන් වී තිබීමයි. (2) අධික/ මන්ද අනාවරණය වී තිබීමයි.

(3) නිවැරදි රාමුව ඇතුළත් වී තිබීමයි. (4) ක්ෂේත්‍ර ගැඹුර පාලනය වී තිබීමයි.

30. පෞද්ගලික මාධ්‍ය ආයතන තම පැවැත්ම සඳහා අවශ්‍ය ආදායම් උපයා ගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය,

(1) රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීමයි. (2) ධන පරිත්‍යාගශීලීන්ගේ පරිත්‍යාග ලබා ගැනීමයි.

(3) මාධ්‍ය අවකාශය දැන්වීම් සඳහා අලෙවි කිරීමයි. (4) කොටස් කරුවන්ගේ මූල්‍ය අනුග්‍රහය ලබා ගැනීමයි.

31. ශ්‍රී ලංකාවේ මුල් යුගයේ පළමු පුවත්පත්වල නම් හා එහි හිමිකාරීත්වය පිළිබඳ සදොස් ප්‍රකාශනය තෝරන්න.

(1) සිංහල බෞද්ධයා - මහාබෝධි ව්‍යාපාරය (2) කම්කරුවා - සූරියමල් ව්‍යාපාරය.

(3) සිංහල බලය - සිංහල මහා සභාව (4) ඥානාර්ථ ප්‍රදීපය - රෙපරමාදු සභාව

32. කාන්තාවන්ගේ මාධ්‍ය පරිහරණ විලාසය රූපවාහිනී මාධ්‍යයට බලපා ඇති අවස්ථාවකි.

(1) රූපවාහිනිය දෘශ්‍ය මාධ්‍යයක් වීම. (2) රූපවාහිනිය විචිත්‍රාද්භූත (Romantic) මාධ්‍යයක් වීම.

(3) රූපවාහිනිය සුලලිත මාධ්‍යයක් වීම. (4) රූපවාහිනිය තොරතුරු මාධ්‍යයක් වීම.

33. ක්ෂේත්‍ර ගැඹුර සංකල්පය නිවැරදිව විස්තර කර ඇති වරණය තෝරන්න.

(1) කැමරා කාචයේ නාභිය දුර ක්ෂේත්‍ර ගැඹුරයි.

(2) කැමරාව හා වස්තුව අතර දුර ක්ෂේත්‍ර ගැඹුරුයි.

(3) කැමරා කාචයට හසුවන දර්ශන කෝණය කේෂත්‍ර ගැඹුරුයි.

(4) වස්තුවේ සිට ඉදිරියට පසුපසට නාභිගතවන දුර ක්ෂේත්‍ර ගැඹුරුයි.

34. පොතක ISBN අංකය සම්බන්ධ නිරවද්‍ය වගන්තිය තෝරන්න.

(1) පොතක අන්තර්ගතයේ ප්‍රමිතිය දක්වන අංකන ක්‍රමයකි.

(2) පොතක දේශීය වශයෙන් පිළිගැනීමට ලක්කරන අංකන ක්‍රමයකි.

(3) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩලය ලබාදෙන අංකන ක්‍රමයකි.

(4) පොතේ කඩදාසි වල ප්‍රමිතිය දක්වන අංකන ක්‍රමයකි.

35. අසාමාන්‍යබව (Unusualness) ප්‍රවෘත්තියක වටිනාකම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයකි. මෙමගින් අදහස් වන්නේ,

(1) ප්‍රවෘත්තියක් මගින් සමාජයට කරන බලපෑම් ප්‍රමාණය යන්නයි.

(2) අමුතු අදහාගත නොහැකි තොරතුරු සහිත ප්‍රවෘත්තිය යන්නයි.

(3) ප්‍රවෘත්තිය ග්‍රාහකත්වයට අදාළ වීම යන්නයි.

(4) සමාජ ප්‍රභූවරුන්ගේ අසමාන හැසිරීම් දක්වන ප්‍රවෘත්ති යන්නයි.

36. මාධ්‍ය ආයතන හිමිකම ග්‍රාහකයා කෙරෙහි වැඩිම බලපෑමක් සිදුකරන්නේ,

(1) සූක්ෂම මනෝ විද්‍යාත්මක ක්‍රම යොදාගෙන ග්‍රාහක මනස පෙළඹවීම මගිනි.

(2) ශාස්ත්‍රීය වැඩසටහන් බහුලව විකාශනයට අවසර ලබා නොදීම මගිනි.

(3) ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් වෙළඳ දැන්වීම්වලට වැඩි ඉඩක් ලබාදීම මගිනි.

(4) සිය නාලිකාව පිළිබඳ අතිශෝක්ති වර්ණනාවක් කර ග්‍රාහකයා ඊට පොළඹවා ගැනීම මගිනි.

37. ශාස්ත්‍රීය සන්නිවේදන ගවේෂණ ලෝකයට බාධක / ඝෝෂාව යන සන්නිවේදන මූලිකාංගය හඳුන්වාදුන්නේ,

(1) වෝල්ටර් ලිප්මාන් - චාල්ස් කූලී ය. (2) ක්ලෝඩ් ෂැනොන් - වොරන් වීවර් ය.

(3) ලැස්වෙල් - මාෂල් මැක්ලුහන් ය. (4) ලැසාස්ෆෙල් - කර්ට් ලෙවින් ය.

38. එක්තරා දේශකයෙක් සරල ගණිත කර්ම ඉගැන්වීමේදී ජංගම දුරකථනයේ වූ ක්‍රීඩා භාවිත කළේය. මේ අවස්ථාවේදී දේශකයා සිය දේශනයට ආදේශ කරගත් සන්නිවේදන අරමුණු යුගල පිළිවෙලින් දක්වා ඇත්තේ,

(1) පෙළඹවීම - අධ්‍යාපනය (2) අධ්‍යාපනය - තොරතුරුසම්පාදනය

(3) විනෝදය - පෙළඹවීම. (4) අධ්‍යාපනය - විනෝදය

39. චිත්‍ර පටයක වේෂ නිරූපණ ශිල්පියා දායක වන කාර්යය,

(1) විධිමත් සන්නිවේදන අවස්ථාවකි. (2) අවිධිමත් සන්නිවේදන අවස්ථාවකි.

(3) වාචික සන්නිවේදන අවස්ථාවකි. (4) අවාචික සන්නිවේදන අවස්ථාවකි.

40. විද්‍යුත් පුවත්පතක ලක්ෂණ සම්බන්ධයෙන් පිළිගත හැකි ප්‍රකාශය තෝරන්න.

(1) යාවත්කාලීන කිරීමේ වැඩි පහසුවක් හිමි පුවත්පත් වර්ගයකි.

(2) ටැබ්ලොයිඩ් හා බ්‍රොඩ්ෂීට් ප්‍රමාණයේ පුවත්පත් වර්ගයකි.

(3) පුවත්පත්වල හිස් වූ ස්ථාන පුරවන පූරක පුවත්පත් වර්ගයකි.

(4) කල්ගත වී පුවත් ලබාදෙන පුවත්පත් වර්ගයකි.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

11 ශ්‍රේණිය
Grade 11

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

පැය දෙකයි
Two hours

සැලකිය යුතුයි.

- පළමුවැනි ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද, ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමිවන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

(01) ජයසිරිගම පාසැලේ වාර්ෂික ක්‍රීඩා උත්සවය මෙවරත් උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට විදුහල්පති තුමා තීරණය කළ අතර, එහි සියලු නිවේදන කටයුතු මෙහෙය වීම පාසල් මාධ්‍ය සමාජය (School Media Club) වෙත පැවරිය.

(i) ඉහත විස්තරය අනුව විදුහල්පති තුමාගේ භූමිකාව හැඳින්වීමට යොදාගත යුතු සන්නිවේදන මූලිකාංගය නම් කරන්න.

(ii) ක්‍රීඩා උත්සවයේදී කරන සන්නිවේදනය සමූහ සන්නිවේදනයට අයත් වේ. එහිදී සමූහය හා ඉදිරිපත් කරන්නා අතර සම්බන්ධය ගොඩනැංවීමට බලපාන සාධක දෙකක් සඳහන් කරන්න.

(iii) ඕනෑම නිවේදකයකු සිය සන්නිවේදන කටයුතු වලදී භාෂාව සම්බන්ධ අංග කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. එවැනි අංග දෙකක් ලියන්න.

(iv) නිවාසාන්තර තරඟය සම්බන්ධ රාජකාරී ලිපියක් පාසල් කාර්යාලයට ලැබුණි. එම ලිපිය විදුහල්පතිතුමා අතට පත්වීම දක්වා වූ මාධ්‍ය ක්‍රියාවලිය ඊතල සටහනකින් දක්වන්න.

(v) මෙම ක්‍රීඩා උත්සවයේ මාධ්‍ය දායකත්වය රාජ්‍ය මාධ්‍යයට පමණක් සීමා කෙරුණි. ජනමාධ්‍ය ආයතන හා රාජ්‍ය අරමුණු අතර සහ සම්බන්ධය කරුණු දෙකක් මගින් දක්වන්න.

(vi) ක්‍රීඩාව තුළින් යහපත් පුරවැසියකු බිහි වේ. පුරවැසියකුගේ ලක්ෂණ හතරක් ලයිස්තුගත කරන්න.

(vii) ක්‍රීඩා උත්සවයේ ඡායාරූප ලබාගන්නා විට ස්වර්ණමය රීතිය (The golden rule) අනුගමනය කරන ආකාරය රූ සටහන් සහිතව දක්වන්න.

(viii) ක්‍රීඩා උත්සවය පිළිබඳ පුවත්පත් වාර්තාවක් මාධ්‍ය සමාජය විසින් පිළියෙල කිරීමේදී යොදාගත යුතු තොරතුරු රැස්කිරීමේ ශිල්ප ක්‍රම දෙකක් නම් කරන්න.

(ix) පාඨකයා අනුව පුවත් පළ කරන එක් ආකාරයක් වන්නේ ක්‍රීඩා පුවත්පතයි. එවැනි පුවත්පත් පළ කිරීමේ විශේෂතා දෙකක් සඳහන් කරන්න.

(x) පාසල් මාධ්‍ය සමාජය රචනා කරන 'ක්‍රීඩා උත්සවයේ තතු' නමැති විශේෂාංග පුවත්පත් ලිපියට පෝල් D මැසිනියර් ගේ සූත්‍රය ආදේශ කරගන්නා ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 2x 10 = 20)

(02) ගමේ දහම් පාසලේ ලොකු හාමුදුරුවන් වහන්සේ 'බුදුහිමිගේ සන්නිවේදන ක්‍රම' මැයින් පාඩමක් සිසුන්ට කියාදුන් අතර, එහිදී මිතුරකු සමග කථා කරන විට මනා සිහියෙන් කථා කළයුතු බවත්, පිටකළ වචන අලි ඇතුන් ලවාවත් ආපස්සට ගත නොහැකි බව ප්‍රකාශ කළ සේක.

(i) ඔබ මිතුරෙකු සමග කථාකරන අවස්ථාවක දක්නට ලැබෙන සන්නිවේදනයේ මූලික ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 01)

(ii) ඔබ ඉහත (i) හි නම් කළ සන්නිවේදන වර්ගය මානව සමාජයේ පැවැත්මට බලපාන ආකාර දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(iii) මෙම සන්නිවේදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී පවා දොරටුපාල සංකල්පය භාවිත කිරීමට සිදු වේ. එම සංකල්පයෙන් සමාජයකට ලැබිය හැකි වාසි තුනක් විස්තර කරන්න. (ලකුණු 03)

(iv) ඔබ (i) හි නම් කළ සන්නිවේදන වර්ගය ජන සන්නිවේදනයට වඩා වෙනස් වන ආකාර හතරක් සංසන්දනාත්මකව ලියන්න. (ලකුණු 04)

(03) ඔබගේ මිත්‍රයෙකු වන සුරේෂ්ට රජයේ කාර්යාලයක කණිෂ්ඨ විධායක ලෙස පත්වීමක් ලැබී ඇතැයි සිතන්න.

(i) සුරේෂ් රාජකාරිය තුළ දී භාවිත කළ යුතු විධිමත් සන්නිවේදන ස්වරූප දෙකක් නම් කරන්න. (ල. 01)

(ii) සුරේෂ්ට තම රාජකාරී කටයුතු පහසු කර ගැනීමට වෙබ් අඩවියක් ආරම්භ කිරීමට අවසර ලබා දුනි වෙබ් අඩවියක් පවත්වාගෙන යාමේ වාසි හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iii) මෙම නිලධාරි මහතා පරිගණක ආශ්‍රයෙන් සිය රාජකාරි කටයුතු කිරීමේදී ඉහළම දක්ෂතා දැක්වූයේ ය. 'පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ අවශ්‍යතාව' මැයින් කරුණු තුනක් ආශ්‍රය කරගෙන පුවත්පතකට විශේෂාංග ලිපියක් සම්පාදනය කරන්න. (ඔබේ පිළිතුර වචන 50 කට සීමා කරන්න.) (ලකුණු 03)

(iv) ඉහත නම සඳහන් නිලධාරියාට 'වැඩලෝකය හා එහි ප්‍රවණතා' මැයින් දේශනයක් කිරීමට සිදුවිය. වැඩ ලෝකයට ජනමාධ්‍ය දායක කරගත හැකි ආකාර හතරක් විස්තර කරන්න. (ලකුණු 04)

(04) ජයසිරිගම විද්‍යාලයේ වාර්ෂිකව පවත්වන ක්‍රීඩා උත්සවයට පැමිණෙන ආරාධිතයින්ට විද්‍යාලයීය ලිපි ශීර්ෂ සහිත ආරාධිත ලිපි සාමාන්‍ය තැපෑලෙන් හා විද්‍යුත් තැපෑලෙන් යැවීමට විදුහල්පතිතුමා තීරණය කරන ලදී.

(i) ආරාධිත ලිපියේ අඩංගු විය යුතු අත්‍යාවශ්‍ය අංග දෙකක් නම් කරන්න. (ලකුණු 01)

(ii) ඉහත ලිපි සැකසීමට කාර්යාලීය මාධ්‍ය උපකරණ භාවිත කිරීමෙන් අත්පත් කරගත හැකි වාසි දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iii) විද්‍යුත් තැපෑලෙන් ඉහත සඳහන් ලිපි යැවීමට කාර්යාලයේ තිබිය යුතු පහසුකම් තුනක් ලියන්න. (ලකුණු 03)

(iv) ක්‍රීඩා උත්සවය පිළිබඳ පාසැල් සිසුන් හා දෙමාපියන් දැනුවත් කිරීමට විදුහල්පති තුමාට යොදාගත හැකිව තිබූ සන්නිවේදන විධික්‍රම දෙක බැගින් හතරක් වෙන වෙනම ලියා දක්වන්න. (ලකුණු 04)

(05) නවීන් නිදහස් පුවත්පත් කලාවේදියෙකි. එසේම ඔහු වැඩසටහන් නිෂ්පාදකයකු ලෙස ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය සමග ද සබඳතා පවත්වනු ලැබේ.

(i) ජන මාධ්‍ය හිමිකමේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න. (ලකුණු 01)

(ii) නවීන්ට තම වෘත්තියේ දී අභාසාරි මාධ්‍ය කලාව (Convergent Media) අභියෝගයක් වන ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iii) නවීන් නම් නිදහස් මාධ්‍යවේදියා සමාජයේ මානව හිමිකම් ආරක්ෂා කිරීමට ක්‍රියාකළ යුතු ආකාර තුනක් සවිස්තරව දක්වන්න. (ලකුණු 03)

(iv) ඕනෑම පුවත්පත් කලාවේදියෙකුට SLR කැමරාවක් භාවිත කිරීම අනිවාර්යය වේ. එහිදී කාච වර්ග (Lenses) භාවිත කළ යුතු ආකාරයන් හතරක් වෙනවෙනම පැහැදිලි කරන්න. (ලකුණු 04)

(06) සෑම තොරතුරක් ම ප්‍රවෘත්තියක් නොවුවද සෑම ප්‍රවෘත්තියක්ම තොරතුරකි.

(i) තොරතුරුවල ගුණාත්මක බව රඳා පවතින මූලික සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 01)

(ii) ඔබට තොරතුරුවලින් ඇති ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

(iii) තොරතුරු පුවත්පතකට ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු සාධක තුනක් දක්වන්න. (ලකුණු 03)

(iv) තොරතුරු රැස් කරන්නෙකු සතු විය යුතු මූලික ගුණාංග හතරක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 04)

(07) ජන මාධ්‍ය වර්ග අතර මුද්‍රිත මාධ්‍ය ප්‍රධාන ස්ථානයක් ගනී.

(i) ප්‍රාග් මුද්‍රිත මාධ්‍ය ස්වරූප දෙකක් නම් කරන්න. (ලකුණු 01)

(ii) මුද්‍රිත මාධ්‍ය ස්වරූප දෙකක් නම් කර, ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් සපයන්න. (ලකුණු 02)

(iii) බ්‍රෝඩ්ෂීට් පුවත්පත හා ටැබ්ලොයිඩ් පුවත්පත අතර වූ මූලික වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iv) 'සාමාන්‍ය මුද්‍රිත පුවත්පතකට වඩා විද්‍යුත් පුවත්පතක් වෙනස් වේ.' ඔබ මේ ප්‍රකාශයට එකඟ වන්නේද? කරුණු හතරක් ඇසුරෙන් සනාථ කරන්න. (ලකුණු 04)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (4) | 02. (3) | 03. (2) | 04. (4) | 05. (2) | 06. (1) | 07. (4) | 08. (3) | 09. (2) | 10. (4) |
| 11. (1) | 12. (3) | 13. (2) | 14. (4) | 15. (3) | 16. (1) | 17. (4) | 18. (1) | 19. (2) | 20. (3) |
| 21. (4) | 22. (2) | 23. (1) | 24. (3) | 25. (3) | 26. (4) | 27. (2) | 28. (1) | 29. (2) | 30. (3) |
| 31. (4) | 32. (2) | 33. (4) | 34. (3) | 35. (2) | 36. (1) | 37. (2) | 38. (3) | 39. (4) | 40. (1) |

## පිළිතුරු පත්‍රය - II පත්‍රය

(01) (i) සන්නිවේදකයා (ලකුණු 2)

(ii) ග්‍රාහක පෞද්ගලික අරමුණු හා අපේක්ෂා / ග්‍රාහක සාක්ෂරතාමට්ටම / ග්‍රාහක අත්දැකීම් පසුතලය / සන්නිවේදනය සිදුවන වේලාව - ස්ථානය / සන්නිවේදකයාගේ කථික දක්ෂතාව / කරුණුවල ගුණාත්මකබව / ඉදිරිපත් කිරීමේ විලාශය / යොදා ගන්නා මාධ්‍ය උපකරණ / ප්‍රතිචාරවලට ලබාදෙන කාලය. (ලකුණු 1x2=2)

(iii) උච්චාරණය / අර්ථ ගැන්වීම / යෝග්‍යතාව (ලකුණු 1x2=2)

(iv) ලිපිය ලැබීම → කවරය තැබීම → ලැබීමේ දින මුද්‍රා සටහන → පොතක සටහන් තබා අංශයට බාරදීම. → ලිපි බාර ගැනීමේ මුද්‍රා සටහන → විදුහල්පතිතුමාට බාර දීම. (උපරිම පියවර 04 කට පමණක් -ලකුණු 2)

(v) රජය ස්ථාවරව පවත්වාගෙන යාම / විවිධ සංවර්ධන සැලසුම් සම්පාදනයට හා ක්‍රියාත්මක කිරීමට / මහජන මතය හිතකරව පවත්වාගෙන යාමට / රජයේ දේශපාලන ප්‍රතිපත්තිය හා දර්ශනය මහජනයා තුළ තහවුරු කිරීම. (ලකුණු 1x2=2)

(vi) ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත් වීම / ඡන්ද අයිතිය පාවිච්චි කිරීම / බදු ගෙවීම / නීතිගරුක වීම / සමාජ ශුභසාධනයට කටයුතු කිරීම / දේශාභිමානීව කටයුතු කිරීම / සියලු ආගම් වලට හා ජාතීන්ට ගරු කිරීම / යහපත් වෘත්තියක නියැලීම / ආචාරශීලීව හා ගුණගරුක වීම / පවුල තුළ යහපත්ව ජීවත් වීම. (ලකුණු ½ x4=2)

(vii) රූප රාමුවක් සකස් කිරීමේදී වැඩියෙන් අවධානය යොමු විය යුතු වස්තූන් එම ස්ථානවල තැබීමයි.



(රූපයට - ල. 01, විස්තරයට ල. 01)

(viii) සම්මුඛ සාකච්ඡා / ප්‍රශ්නාවලි / නිරීක්ෂණය / ලේඛන පරිශීලනය / බුද්ධි කලම්භනය (ලකුණු 1x2=2)

(ix) මිල දී ගන්නා පුද්ගලයා තුළ තම පාඨකත්වය පිළිබඳ හැඟීමක් ඇතිවීම / අදාළ පණිවිඩය සුදුසු පාඨකයා වෙත ම ලැබීම / පුවත්පත සඳහා නිශ්චිත පාඨක සමාජයක් ඇතිවීම. / පුවත්පත ආශ්‍රිතව වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක වීම / විශේෂ සමාජ අවශ්‍යතා සඳහා පහසුවෙන් යොදාගත හැකි වීම. (ලකුණු 1x2=2)

(x) A + B + C = C (නිවැරදි බව + සමතුලිතබව +පැහැදිලි බව = විශ්වාසනීයත්වය යන්න දැක්වීම අපේක්ෂා කෙරේ.) (ලකුණු 2)

(02) (i) දෙදෙනෙකු සහාගී වීම / ප්‍රතිපෝෂණ එවෙලේ ම ලැබීම / සජීවී බව / වාචික - නිර්වාචික චර්යා අන්තර්ගත වීම / තාක්ෂණික උපකරණ භාවිත කළ හැකි වීම. / සන්නිවේදන බාධක අඩු වීම / මුහුණට මුහුණ බලා සන්නිවේදනය කළ හැකි වීම / S → R සම්බන්ධය සමීපය සෘජු ය. (ලකුණු ½ x2=1)

(ii) සමජ අඛණ්ඩභාවය පවත්වාගැනීම / පුද්ගලයාගේ පුද්ගලික ජීවිතය / වෘත්තීය ජීවිතය / සමාජ ජීවිතය පවත්වා ගැනීමට / පුද්ගලයා හුදකලා වීම වැලැක්වීමට.

(නම් කිරීමට පමණක් ල. ½ x2=1 කෙටියෙන් විස්තර කිරීමට 1 x2=2)

(iii) අනවශ්‍ය තොරතුරු සමාජ ගත වීම වැලක්වීමට / ප්‍රශස්ථයන් - නියාමනයකට මඟ පෑදීම / විධිත් සන්නිවේදන රටාවක් අනුගමනය කිරීමට ජන මාධ්‍යවලට බලපෑම් කළ හැකි වීම. / සන්නිවේදන පීඩාවලින් සමාජය මුදවා ගැනීමට හැකි වීම. / රජයට පක්ෂපාතී මාධ්‍ය සත්කාරයක් ස්ථාපිත කර ගැනීමට හැකි වීම. / ඉහළ මාධ්‍ය සංස්කෘතියක් ස්ථාපිත වීම. (විස්තර කිරීමට පමණක් ල. 1 x3=3 නම් කිරීමට ලකුණු නොමැත.)

(iv)

| පුද්ගලාන්තර සන්නිවේදනය | ජන සන්නිවේදනය |
|---|---|
| 1. දෙදෙනෙක් සහභාගී වේ. | කෝටි ගණනක් සහභාගී වේ. |
| 2. සජීවී වේ. | සජීවී බව අඩුය. |
| 3. ක්ෂණික සෘජු ප්‍රතිපෝෂණයක් ඇත. | සුවාධීන ප්‍රතිපෝෂණයක් ඇත. |
| 4. තාක්ෂණය භාවිතය අනිවාර්යය නැත. | අධිතාක්ෂණයක් භාවිත කරයි. |

(පෙන්වා දීමට පමණි. -ලකුණු 1 x4=4)

(03) (i) ඉහළ - පහළ / පහළ - ඉහළ / හරස් සන්නිවේදනය (ලකුණු ½ x2=1)

(ii) ලෝකය පුරා තොරතුරු ව්‍යාප්තිය පහසුවෙන් කළ හැකි වීම. / තොරතුරු ග්‍රහණය කරගත හැකි වීම. /පහසුවෙන් තොරතුරු යාවත්කාලීන කළ හැකිවීම / කාර්යන් සමාජයට පහසුවෙන් විවෘත කළ හැකි වීම. / කටයුතු විධිමත්ව පවත්වා ගැනීමට / තොරතුරු වේගවත්ව නිකුත් කළ හැකි වීම. / ප්‍රතිචාර වේගවත්ව ලබා දීමට හා ලබා ගැනීමට හැකි වීම. / ආයතන - ආයතන අන්තර් ක්‍රියාව වේගවත් වීම.

(කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු ½ x4=2 - නම් කිරීමට ලකුණු නොමැත.)

(iii) අඩු පිරිවැය / ආකර්ෂණීය නිමාව / ඉක්මන් බව / පහසුව / කාර්යක්ෂමතාව.....
මෙම කරුණු විශේෂාංග ලිපි ආකෘතියකට අනුව විස්තර කළ යුතුය. (උපරිම වචන 50)

(විස්තරයට පමණි. ල. 1 x 3 = 3 - නම් කිරීමට ලකුණු නැත.)

(iv) වැඩ ලෝකය හැඳින්වීමට / ප්‍රවණතා සැසැඳීමට / ආකල්ප වෙනස් කිරීමට / පෙළඹවීමට / ග්‍රාහක ප්‍රතිචාර ගෙනයාමට / වැඩ ලෝකය පුළුල් කිරීමට හා ප්‍රතිසංවිධානයට උපදෙස් දීමට / ඇබෑර්තු ප්‍රකාශයට

(විස්තරයට පමණි. ල. 1 x 4 = 4 - නම් කිරීමට ලකුණු නැත.)

(04) (i) යවන්නාගේ නම හා ලිපිනය / දිනය / ලබන්නාගේ ලිපිනය හා නම / ලිපි ශීර්ෂය / ස්ථානය / උත්සවය පවත්වන දිනය - වේලාව / යවන්නාගේ අත්සන / යවන්නාගේ නිල මුද්‍රාව / මාතෘකාව

(නම් කිරීමට ල. ½x2=1)

(ii) කඩිනමින් තොරතුරු සැපයීමට / උපදෙස් හා විධාන දීමට / සේවක අභිප්‍රේරණයට / කාර්‍යක්ෂමතාව වඩි කිරීමට / ලේඛනවල ආකර්ශණීය බව වැඩි කර ගැනීමට / විශ්වාසවන්ත බව වැඩි කර ගැනීමට / ඵලදායිතාව වැඩි කර ගැනීමට. (නම් කිරීමට පමණි. ල. ½ x 2 = 1 - කෙටියෙන් විස්තර කිරීමට ල. 1x2=2)

(iii) දුරකථනය / මොඩමය / පරිගණකය / අන්තර්ජාල පහසුකම් / ඩොන්ගල් එකක් / රවුටරයක්

(නම් කිරීමට ලකුණු නොමැත. - පෙන්වා දීමට ල. 1 x 3 = 3)

(iv) පාසැල් සිසුන් - දැන්වීම් පුවරුව / පාසැල් ඇමතුම් පද්ධතිය / පාසැල් උදෑසන රැස්වීම / පන්තිභාර හෝ අංශභාර ගුරුභවතුන් මගින් / ශිෂ්‍යනායක මණ්ඩලය මගින් / පාසැල් ගුවන් විදුලි සේවා - උදා පුවත් සේවය මගින් / බිත්ති පුවත්පත මගින්.

දෙමාපියන් - ලිපි /SMS / විද්‍යුත් තැපැල / දෙමාපිය රැස්වීම් මගින් / මාධ්‍ය දැන්වීම් / පෝස්ටර් - බැනර් අත් පත්‍රිකා මගින් / විශාල කටවුට් එකක් විද්‍යාලය ඉදිරිපිට ප්‍රදර්ශනය මගින්.

(ලියා දැක්වීමට ල. 1 x 4 = 4 - එක් මාතෘකාවකින් උපරිම කරුණු දෙකක් ලිවිය යුතුය.)

(05) (i) මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍යය (නම් කිරීමට ල. ½x2=1)

(ii) මාධ්‍යකරුවන්ගේ පැවැත්මට අභියෝගයක් වීම. / මධ්‍ය ව්‍යුහ වෙනස් වීම. / වෘත්තීය කාර්යයක් වේගවත් වීම. / ඉංග්‍රීසි හා ICT දැනුම අනිවාර්ය්‍ය වීම. / මාධ්‍යකරුගේ වෘත්තීය ඉඩ පුළුල් වීම.

(නම් කිරීමට පමණි. ල. ½ x 2 = 1 - පෙන්වා දීමට - ල. 1x2=2)

(iii) මානව හිමිකම් ගැන සමාජය දැනුවත් කිරීම. / බලපෑම් කණ්ඩායමක් ලෙස ක්‍රියා කිරීම / ආරක්‍ෂා කරන්නන්ට ප්‍රශංසා කිරීම. / මානව හිමිකම් නීතිවල දුර්වලතා පෙන්වා දීම.

(සවිස්තරව දැක්වීමට පමණි. ල. 1 x 3 = 3 - නම් කිරීමට ලකුණු නැත.)

(iv)
* සාමාන්‍ය කාච - පියවි ඇසට පෙනෙන දර්ශනයට සමාන ලෙස වස්තු හමු වේ.
* දුර රූප කාච - දුර පිහිටි වස්තු සමීප දසුන් ලබා ගැනීම.
* පුලුල් කෝෂ කාච - පුළුල් පරාසයක ඇති වස්තු ඡායාරූප හසුකර ගැනීමට.
* යුහුමු කාච - දුර / ලඟ පරාසයක ඡායාරූප ගත හැකිවීම.

(පෙන්වා දීමට පමණි. ල.1x4=4- නම් කිරීමට ලකුණු නැත.)

(06) (i) නිවැරදිබව / නිශ්චිතබව / කාලෝචිතබව / සහේතුකව සංවිධානය / අර්ථාන්විතබව. (නම් කිරීමට ල. ½x2=1)

(ii) පුද්ගල අවශ්‍යතා සපුරාලීමට / තීරණ ගැනීමට / පුද්ගල සබඳතා පවත්වා ගැනීමට / අධ්‍යාපන කටයුතු වලට / ගැටලු නිරාකරණයට / නිර්මාණශීලී චින්තනයට

(නම් කිරීමට ල. ½ x 2 = 1 - කෙටියෙන් විස්තර කිරීමට ල. 1x2=2)

(iii) නිවැරදි බව / සමතුලිතබව / පැහැදිලිබව / විශ්වාසනීයත්වය

(පෙන්වා දීමට ල.1x3=3 - නම් කිරීමට ලකුණු නැත.)

(iv) පුවත් ඉව / උපයාශීලීබව / ස්ථාරතාව / අපක්ෂපාතීබව / විචක්ෂණබව / කාල කළමනාකරණය / සුහදබව / ආචාරශීලීත්වය / ප්‍රබල නිරීක්ෂණය / ඉවසීම / තොරතුරු මූලාශ්‍ර පිළිබඳ දැනුම.

(විස්තරයට පමණි. ල. 1 x 4 = 4 - නම් කිරීමට ලකුණු නැත.)

(07) (i) ඇක්ටාඩියුර්නා / ක්වාරබාන් මැටි පුවරුව / රාජ්‍ය සන්නිවේදනය

අතින් ලියන ලද බ්‍රිතාන්‍ය පුවත්පත් / රුසියාවේ Courant නමින් අතින් ලියූ පුවත් පත් / ඉටි ගාන ලද ලෑලි

(නම් කිරීමට ල. ½x2=1)

(ii) පොත් / පුවත්පත් / සඟරා / පෝස්ටර් / අත්පත්‍රිකා (නම් කිරීමට ල. ½x2=1 - විස්තරයට ල. 1x2=2)

(iii) බ්‍රෝඩ්ෂීට් පුවත්පත - පළල් පිටු සහිතය / ජාතික - අන්තර් ජාතික තේමා තිබීම / උසස් ජන සන්නිවේදන ක්‍රියාත්මකව තිබීම / නිශ්චිත - විධිමත් ආකෘති තිබීම.

ටැබ්ලොයිඩ් පුවත්පත් - පළල් පිටුවලින් හරි අඩක් වීම / සරල තේමා තිබීම / මෘදු - සංවේදී - විනෝදාත්මක - ත්‍රාසජනක අංගවලින් යුක්ත වීම / ආකර්ෂණය හා සරල ආකෘතිවලින් යුක්ත වීම. (ලකුණු 1x3 = 3)

(iv) ප්‍රකාශයට එකඟ වේ.

ක්ෂණික පුවත් දැනගැනීමේ හැකියාව / ගබඩාකර තබා ගැනීමේ පහසුව / නැවත නැවත කියවීමේ හැකියාව / තොරතුරු විෂය අනුව වර්ග කර තිබීම / යාවත්කාලීන කිරීමේ පහසුව / ක්ෂණික පාඨක ප්‍රතිචාර ලැබීම.

(සනාථ කිරීමට ල.1x4=4- නම් කිරීමට ලකුණු නැත.)

ලකුණු බෙදීයන ආකාරය

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | | = ල. 2x40 | = 40 |
| II පත්‍රය | 1 වන ප්‍රශ්නය | = ල. 20 | = 20 |
| | 2-7 වන ප්‍රශ්න (10 x4) | = ල. 40 | = 40 |
| I+II | මුළු ලකුණු | | = 100 |